03 - 6 - 2006


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1447/9 – 2006 මැයි 30 වැනි අඟහරුවාදා – 2006.05.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාත් සභාව

2006 අංක 01 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2006.04.04 වැනි දින සම්මත කරනු ලදුව, 2006.04.20 වැනි දින වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේම දැනගැනීම සඳහා මෙහි පළකරමි.

එස්. එම්. ජයතිලක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

2006 මැයි මස 16 වැනි දින,
කුරුණෑගල,
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේදී ය.

වයඹ පළාතේ පළාත් සභාවේ 2006 අංක 01 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය

2000 අංක 3, 2001 අංක 2, 2002 අංක 3 සහ 2004 අංක 4 දරන ප්‍රඥප්ති වලින් සංශෝධිත වයඹ පළාතේ පළාත් සභාවේ 1989 අංක 3 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය

1. මෙම ප්‍රඥප්තිය වයඹ පළාතේ පළාත් සභාවේ 2006 අංක 01 දරන පළාත් සභා (වැටුප් හා දීමනා ගෙවීමේ) (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඉ) සහ 2(ඊ) උපවගන්ති සංශෝධනය කිරීම

2. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඉ) උප වගන්තියේ සඳහන් 'රුපියල් හත්දහස් පන්සියයක්ද' යන පාඨය ඉවත්කොට, ඒ වෙනුවට රුපියල් දස දහසක්ද, යන පාඨය ඇතුළත් කිරීමෙන් ද,

(2) ප්‍රධාන ප්‍රඥප්තියේ 2(ඊ) උප වගන්තියේ සඳහන් 'රුපියල් හයදහස් දෙසිය පනහක්ද' යන පාඨය ඉවත්කොට, ඒ වෙනුවට රුපියල් 'හත්දහස් පන්සියයක්ද' යන පාඨය ඇතුළත් කිරීමෙන් ද,

සංශෝධනය කරනු ලැබේ.

අනනුකූලතාවයක් වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

06-388

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.